# <u>නිවේදනය</u> A

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) වන ව්‍යවස්ථාව අනුව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කරන ලද **"රජයේ ඉඩම් (විශේෂ විධිවිධාන)"** නමැති පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

123 ව්‍යවස්ථාව සමග කියැවෙන 120 ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම අදාළ පනත් කෙටුම්පත පළාත් සභා ලැයිස්තුවේ විෂයය පථයට අදාළ වන බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ(3) ව්‍යවස්ථාවෙන් දක්වා ඇති පරිදි පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට පෙර, අදහස් ප්‍රකාශ කිරීම පිණිස අතිගරු ජනාධිපතිතුමා විසින් සෑම පලාත් සභාවක් වෙතම යොමු කර ඇත්නම් මිස එය නීතියක් බවට පත් නොවන බව ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළ ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණය වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, 154ජ (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන වලට අනුකූල නොවන පරිදි පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇති හෙයින් අධිකරණය මේ අවස්ථාවේ දී, මෙම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් මතුකළ ඇති අනෙකුත් නෛතික ස්ථාවරයන් සම්බන්ධව තීන්දුවක් ප්‍රකාශයට පත් නොකරන බවයි.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යයි මම නියෝග කරමි.